**ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය - 2017**

**---------------------------------------------------**

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතන පනතේ 14(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 අගෝස්තු 28 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07**

ප්‍රමිතියේ 65 වන වගන්තිය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 201,323,461 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 02**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අඩමාන ණය වෙන් කිරීම් රු.230,828 ක් මෙහෙයුම් ආදායමෙන් ඉවත්කර ණයගැතියන්ට ගලපා නොතිබුණි.

(ii) වර්ෂයට අදාල රු. 21,478,709 ක පොළී ආදායම මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අඩුකොට දක්වා නොතිබුණු අතර, මුදලින් ලැබුනු පොළී ආදායම රු. 15,688,119 ක් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

(iii) නව ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු. 30,000,000 ක මුදල, මූල්‍ය ක්‍රියාකාරකම්වල මුදල් ගලා ඒම් ලෙස දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය වෙනුවෙන් 2017 වර්ෂයේදී ගෙවන ලද බාහිර දේශක ගාස්තු රු. 80,400 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ආ) 2016 වර්ෂයේදී විකුණන ලද ස්ථාවර වත්කම් වලට අදාල වත්කම්වල පිරිවැය හා ක්ෂය වෙන්කිරීම් අදාල ගිණුම් වලින් ඉවත් කිරීමෙන් තොරව එම වත්කම් විකිණීමෙන් ලද රු. 153,950 ක් විවිධ ණයහිමියන් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී විකුණන ලද වාහන 05ට අදාල රු. 3,871,448 ක් වූ විකුණුම් ලාභය විවිධ ණයහිමියන්ට බැර කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුලදීද එම ලාභය ණයහිමි ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වෙළඳණයගැති ශේෂය රු. 14,353,062 කින් රු.3,739,162 ක් එනම් සියයට 26 ක් වසර 04 ඉක්ම වූ ශේෂයන්ගෙන් සමන්විත විය.

(ආ) 2011 වර්ෂයේ ආයතනය පිහිටුවීමේ සිට මේ දක්වාම ලැබිය යුතු ශේෂයන් ලෙස ගිණුම් වල ඉදිරියට ගෙන එමින් පැවති එකතුව රු. 290,441 ක් වූ එකතු කළ අගය මත බදු වටිනාකම නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටද කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත<br>8 උපවගන්තිය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අතිරේක 13 | ගිවිසුම් වටිනාකම රු.8,024,885 ක් වූ භෝජනාගාරයේ යෝජිත අභ්‍යන්තර අලංකාර කටයුතු සිදු කිරීම හා රු. 17,601,850ක් වූ රසායනාගාර උපකරණ මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී පොදු කොන්ත්‍රාත් පනත යටතේ ගිවිසුම් ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2015 ජූලි 14 දිනැති හා අංක 03/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) | තත්කාර්යය සඳහා ලබා ගන්නා ලද අත්තිකාරම්, එකී අදාල කාර්ය නිමකල වහාම නිරවුල් කල යුතු වුවද අවස්ථා 22 කදී ලබාගත් රු.556,720 වූ අත්තිකාරම් දින 11 සිට දින 34ක් දක්වා ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. |
| (ඇ) සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) | තත්කාර්යය අතුරු අග්‍රිමයෙන් ලබා දිය හැකි උපරිම වටිනාකම රු. 100,000 ක් වුවත් එය ඉක්මවා රු.200,000 ක් හා රු. 283, 300 ක් බැගින් අවස්ථා 02ක දී අත්තිකාරම් ලබා දී තිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1994 ජුනි 14 දිනැති අංක 95 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සංස්ථා, මණ්ඩල සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයන් සම්බන්ධයෙන් කෙරෙන සියලුම දීමනා සඳහා අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය මත මහා භාණ්ඩාගාරයේ හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ

අනුමැතිය ලබා ගත යුතු වුවද ආයතනයේ පාලන අධිකාරිය විසින් විවිධ දීමනා ලෙස ආයතනයේ අරමුදලින් 2016 හා 2017 වර්ෂවල දී ගෙවන ලද පිලිවෙලින් රු. 1,574,691 ක් හා රු.1,602,540 ක් සම්බන්ධයෙන් අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵල රු.54,535,545 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.38,418,981 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 16,116,564ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම රු. 13,804,478කින් වැඩිවී තිබුණද, පොලී ආදායම රු. 7,666,425 කින් සහ පුහුණු කිරීම් ආදායම රු.22,906,953 කින් වැඩි වී තිබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මූල්‍ය අතිරික්තයක් ඇතිවී තිබුනද 2015 වර්ෂයේදී අතිරික්තයේ අඩුවීමක් පෙන්නුම් කර තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික,රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේ රු.115,076,875ක් වූ ආයතනයේ දායකත්වය 2014 වර්ෂයේදී රු.137,931,510 දක්වා වර්ධනය වී තිබුනද 2015 වර්ෂයේදී රු.111,088,905 ක් දක්වා පහත වැටී තිබුණි. ඉන් පසුව 2016 වර්ෂයේදී රු. 142,154,257ක් දක්වාද, 2017 වර්ෂයේදී රු. 161,410,561 දක්වා වර්ධනය වී තිබුනි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් 2 : 1 හා 1.: 1 ක් විය යුතු වුවත් ආයතනයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය 2015 වර්ෂයේ 2 : 1 ක් වුවද 2016 වර්ෂයේ 19 : 1 ක් හා 2017 වර්ෂයේ 25 : 1 ක් ලෙස වර්ධනය වී තිබුණි. කළමනාකරණය විසින් අතිරික්ත අරමුදල් ආයතනයේ ප්‍රධාන අරමුණු ඉටුකරගැනීම සඳහා ඵලදායී ලෙස උපයෝජනය කරනු වෙනුවට සමාලෝචිත වර්ෂය අවසානයට රු. 154,169,439 ක් කෙටි කාලීන තැන්පත් වල ආයෝජනය කිරීම මෙයට ප්‍රධාන හේතුව වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී- 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.3 උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව සංශෝධිත අයවැය ලේඛනය රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වුවද ආයතනය විසින් එසේ කර නොතිබුණි.

(ආ) සංශෝධිත අයවැය ලේඛනයට අනුකූලව ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට ආයතනය ක්‍රියාකර නොතිබුණි.

## 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

-----------------------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පාඨමාලා 215 ක් පැවැත්වීම සඳහා සිසුන් 3182 ක සහභාගිවීමක් අපේක්ෂා කල ද, වර්ෂය අවසන් වන විට පාඨමාලා 201 ක් පමණක් පවත්වා, ඒ සඳහා සිසුන්ගේ සහභාගීත්වය 3463 ක් විය. එනම් අපේක්ෂිත පාඨමාලා ප්‍රමාණයට වඩා සත්‍ය ප්‍රමාණය සියයට 6.51 කින් අඩුවී තිබුණු අතර ඒ සඳහා සහභාගිවූ සිසුන් ප්‍රමාණය සියයට 8.83 කින් වැඩිවීමකි. ඒ අනුව ආයතනය විසින් පැවැත්වීමට අපේක්ෂා කරනු ලබන පාඨමාලා පිළිබඳ සැලසුම් සකස් කිරීමේදී සහ සහභාගීත්වය අපේක්ෂා කරනු ලබන සිසුන් සම්බන්ධව තීරණය කිරීමේ දී නිසි පදනමකින් සැලසුම් සකස් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ඉංජිනේරු අංශයේ පාඨමාලා 44 ක් පැවැත්වීම සඳහා සිසුන් 773ක සහභාගිවීමක් අපේක්ෂා කල ද, වර්ෂය අවසන් වන විට සිසුන් 302 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පාඨමාලා 21 ක් පමණක් පවත්වා තිබුණි.

(ඇ) බාහිර පුද්ගලයන්ගේ හා ආයතන වල ඉල්ලීම මත පවත්වනු ලැබූ පාඨමාලා හැර ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ පැවැත්වීමට සැලසුම් කරන ලද පාඨමාලා 146 ක් අතරින් සියයට 13 ක් එනම් පාඨමාලා 19 ක් පමණක් පවත්වා තිබුණි.

(ඇ) 2016 වර්ෂයේදී කුඩා පරිමාණයේ ඇඟලුම් කර්මාන්ත ශාලා 150ක් ඇතිකිරීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමේ පාඨමාලා පැවැත්වීම අරමුණු කර තිබුණද පුහුණු පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් ආයතනයට රේඛීය අමාත්‍යාංශයෙන් වෙන් කර ඇති මුදල රු. මිලියන 06 කි. ඉන් 2016 වර්ෂයේදී රු.1,796,346 ක් හා සමාලෝචිත වර්ෂයේදී රු. 4,325,138 ක් වශයෙන් එකතුව රු. 6,121,484 ක් වැය කර තිබුනද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පුහුණුව ලබා දිය යුතු පුහුණුලාභීන් 150 න් මන්නාරම පුහුණුලාභීන් 15 ක් සඳහා පුහුණුව ලබා දී නොතිබුණි.

(ඉ) නව රැකියා අවස්ථා උත්පාදනය තුළින් පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම, කාන්තාවන් සවිබල ගැන්වීම, සමාජ සංවර්ධනය යන අරමුණු ඉටුකර ගැනීම සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හා එක්ව ක්‍රියාත්මක කර තිබූ ගෘහ ආශ්‍රිත ඇඟළුම් කර්මාන්ත ව්‍යාපෘතියේ යෝජනාවක් ලෙස පුහුණුලාභීන්ගේ නිෂ්පාදන වෙළඳපල වෙත ප්‍රවේශ කිරීම සඳහා උපදේශන සේවා ලබාදීම දැක්වුවද එම කාර්යය ඉටුකරීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. මෙම ව්‍යාපෘතිය සඳහා මහන මැෂින් 2040ක් හා "ඕවර් ලොක්" මැෂින් 41 ක් වෙනුවෙන් රු. 103,598,120 ක් 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය වන විට වැය කර තිබුණද, මෙම පුහුණු ප්‍රතිලාභීන් අදාල කර්මාන්තයේ යෙදෙන බව හා එහිදී ඇති වී තිබෙන ගැටළු පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි.

(ඊ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ දිවියට උදානය ජාතික වැඩසටහනේ පුහුණු වැඩ පටහන් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ආයතනය වෙත පවරා දී තිබුණු නමුත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාලව වැඩසටහන් විස්තරය, කාල රාමුව, පුහුණු කලයුතු පුහුණු ලාභීන් ගණන, ලබාදෙන ලද සේවාව වෙනුවෙන් අයකරගතයුතු ගාස්තු පිළිබඳ දෙපාර්ශවය විසින් ව්‍යාපෘතිය ආරම්භයේදී ගිවිසුමකට එළඹ නොතිබුණි.

(උ) මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු. 202,882,320 ක් වූ මුළු මෙහෙයුම් ආදායම තුල ඇතුලත් "පාලමුනෙයි" නූල් වර්ණ ගැන්වීමේ මධ්‍යස්ථානයේ විකුණුම් ආදායම රු. 978,535 ක් වුවද මෙම මධ්‍යස්ථානයේ වර්ෂයේ අමුද්‍රව්‍ය භාවිතය රු. 2,149,636 ක් වීම හේතුවෙන් රු. 2,641,544 ක ශුද්ධ පාඩුවක් වී තිබුණි. ඉකුත් වර්ෂයේදී පේෂකර්ම දෙපාර්තමේන්තුවෙන් ලද ඇණවුමකට අනුව සායම් කරන ලද නූල් ප්‍රමිතියෙන් තොර වීම හේතුවෙන්, එම නූල් නැවත වර්ණ ගැන්වීමට සිදුවීම මෙම අලාභයට ප්‍රධාන හේතුව වී තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ බඳවා ගැනීම් පරිපාටියේ කණිෂ්ඨ කළමනාකරණ කොටසේ 4.4.4 ඡේදය අනුව වසරකට එක් වතාවක් හෝ කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්විය යුතු වුවද, බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කල 2015 මාර්තු 23 දින සිට වාර්තාවේ දින දක්වා සේවකයින්ගේ තනතුරු වලට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ තාක්ෂණඥ (සම්භාණ්ඩ)තනතුරේ සේවය කල නිලධාරියා ශ්‍රී ලංකා යුධ හමුදාවේ ස්වේච්ඡා බලකායේ සේවය සඳහා 2018 මාර්තු 05 දින සිට මුදාහැර තිබුණු අතර එම අවස්ථාව වන විට "තාක්ෂණ හුවමාරු හා තත්ව ප්‍රවර්ධන වැඩසටහන 2017 " යටතේ වැඩසටහන් 05ක් කෙරීගෙන යන තත්ත්වයේ පැවතුණි. එම තනතුර පුරප්පාඩුවීම හේතුවෙන් මෙම වැඩසටහන් වල ප්‍රායෝගික පුහුණුව ඇන හිට තිබුණු අතර විගණිත දින වූ 2018 අප්‍රේල් 27 දින විටත් එම අංශය වසා තිබුණි. ඒ හේතුවෙන් ආයතනය තුල පාවහන් හා සම් භාණ්ඩ සම්බන්ධව පුහුණු වන්නන්ගේ පුහුණු කටයුතු අඩාල වී තිබුණි.

(ඇ) ආයතනය විසින් වත්කම් ප්‍රත්‍යාගණන කාර්යය කරවා ගැනීම වෙනුවෙන් 2015 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුවට රු. 822,480 ක් ගෙවා තිබුණද, නිවැරදි ප්‍රත්‍යාගණන වාර්තා ලබාගෙන ඒවායේ සාධාරණ අගයන් ගිණුම්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 අනාර්ථික ගණුදෙනු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාවහන් හා සම් භාණ්ඩ අංශය සඳහා 2014 වර්ෂයේදී මිලදී ගන්නා ලද පිරිවැය රු.1,385,200 ක් වූ ලී මේස 22ක් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්ය ලෙස ඉඩකඩ ඇහිරෙන ආකාරයට ප්‍රායෝගික පුහුණු අංශයේ තබා තිබුණු බව භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) ආයතනයේ නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පැරණි ගොඩනැගිල්ලේ කොටසක් කඩා ඉවත් කිරීමට සිදුවන බැවින් එම කාර්යාල කටයුතු සිදු කිරීම වෙනුවෙන් කුලී පදනම මත මාසික වාරිකය රු. 80,000 ක් වූ ගොඩනැගිල්ලක් 2017 ජුනි 01 සිට ලබා ගෙන තිබුණි. විගණිත දිනය වූ 2018 අප්‍රේල් 27 දින වන විටත් නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණු අතර මේ හේතුවෙන් කුලී පදනම මත ලබාගන්නා ලද ගොඩනැගිල්ල භාවිතයට නොගෙන වසා දමා තිබුණි. දින කිහිපයකට පමණක් පුහුණු ශිෂ්‍යයින් කිහිපදෙනෙකුට එම ගොඩනැගිල්ලේ නවාතැන් ලබා දී තිබුණි. එම කුලී ගොඩනැගිල්ලේ ගිවිසුම් කාලය 2018 අප්‍රේල් 16 දින සිට අවලංගු කර තිබුනද මාස 10 ක් සඳහා කුලී වශයෙන් රු. 800,000 ක් ගෙවා තිබුණි.

දෙපාර්ශවය අතර ඇතිකර ගෙන තිබූ ගිවිසුමේ 3(F) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගිවිසුම අවලංගු කරන්නේ නම් මාස 03 කට පෙර ඒ බව අනෙක් පාර්ශවය වෙත දැනුම් දිය යුතු වුවද ආයතනය විසින් ගිවිසුම අවලංගු කරන බව දැනුම් දී ඇත්තේ 2018 මාර්තු 09 දින එනම් දින 38 කට පෙර වේ. මේ හේතුවෙන් ආයතනය විසින් ගෙවා තිබූ රු. 240,000 ක අත්තිකාරම් මුදලින් නැවත 2018 අගෝස්තු 06 දින ආයතනය වෙත ලැබී තිබුණේ රු. 80,000ක් පමණක් වන අතර ආයතනයට රු. 160,000ක පාඩුවක් සිදුවී තිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 140 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 98 ක් වූයෙන් පුරප්පාඩු 42ක් පැවතුණි. වසර දෙකකට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවති මෙම තනතුරු පිරවීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටද කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනයේ කාර්ය මණ්ඩලය තුල ජ්‍යෙෂ්ඨ, තෘතීය හා ද්විතීය මට්ටමේ නිලධාරීන් 82 ක පිරිසක් සේවයේ නියුක්තව සිටින අතර අනුමත වැඩ සහායකවරු සංඛ්‍යාව 13 ක් වුවද තථ්‍ය වශයෙන් සේවයේ නියුක්තව සිටියේ එක් අයෙකු පමණි.

(ඇ) බඳවා ගැනීම් පරිපාටියේ 5.3 ඡේදය අනුව ප්‍රසිද්ධ දැන්වීමක් මගින් අයදුම් පත් කැඳවීමක් සිදු කිරීමෙන් තොරව සහකාර ඉංජිනේරු (තොරතුරු තාක්ෂණ) තනතුර සඳහා නිලධාරියෙකු බඳවා තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

---

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

---

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබූ නමුත් වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත්වීම මත සිය විෂය පථයට අනුව ළගා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

---

2016 වසරේ විගණකාධිපති වාර්තාවේ දැක්වූ ඇති පහත සඳහන් කරුණු වලට අදාලව කටයුතු කර නොතිබුණි.

(අ) වසර 2009 දී ආරම්භ කරන ලද ආයතනය ස්ථාපිත කොට වසර 08 ක් ඉක්මගොස් තිබුණද, 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතන පනතේ 01 කොටසේ 04 (අ) ඡේදය ප්‍රකාරව පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රය පිළිබඳව පශ්චාත් උපාධි සහ උපාධි වැඩසටහන් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ආ) ජාත්‍යන්තර හා ජාතික ප්‍රමිතිවලට සහ සමාගම් ප්‍රමිති පද්ධතිවලට අනුකූලව ජේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයේ නියැලී සිටින තැනැත්තන්ට අනුකූලතා සහතික නිකුත් කිරීම, ආයතනයේ පරමාර්ථයක් වුවද, ආයතනය මගින් පවත්වාගෙන යන "වැඩ අධ්‍යනය" පාඨමාලාව හැර අනෙකුත් පාඨමාලා සඳහා ජාතික වෘත්තිය මට්ටමේ සුදුසුකම් තත්ත්වය(NVQ) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ලබා ගෙන නොතිබුණි.

(ඇ) ධාවනය කිරීමට නොහැකි තත්ත්වයේ ජීප් රථයක් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් 2014 වර්ෂයේ නොවැම්බර් මස තාවකාලික පදනමට ලබාගෙන ඒ සඳහා අලුත්වැඩියා වියදම් ලෙස රු.362,175 ක් වැය කර තිබුණි. නමුත් මෙම වාහනය ධාවනය කලහැකි තත්ත්වයට පත් වී නොතිබුණු බැවින් නැවත අමාත්‍යාංශය වෙත භාර දී තිබූ අතර අලුත්වැඩියාව සඳහා වැය කරන ලද මුදල කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු කැබ් රථය රේඛීය අමාත්‍යාංශයේ භාවිතය සඳහා 2013 සැප්තැම්බර් 04 දින නිදහස් කර තිබිය දී එම වාහනයේ අලුත්වැඩියා වියදම් ලෙස එකතුව රු.910,472 ක් ආයතනය විසින් දරා තිබුණ නමුත් එම මුදල, අමාත්‍යාංශය වෙතින් ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොහැකි වී තිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

### 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---

#### 6.1.1 ප්‍රසම්පාදනයන්

---

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ), (ආ), (ඇ) හා (ඉ) ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුලත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කොට ඊළඟ එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතු බව හා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට නොවැඩි කාලයක් තුල යාවත්කාලීන කල යුතු වුවද ආයතනය විසින් පිලියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම එම අවශ්‍යතාවයන් හා අනුකූල වී නොතිබුණි.

(ආ) ආරක්ෂක සේවාව , පවිත්‍රතා සේවය හා ආයතන කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම යන සේවාවන් සඳහා ලංසු කැඳවීමේ ක්‍රියාවලියට සහභාගී වන සියලුම ලංසුකරුවන් විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 විධිවිධාන පරිදි නියමිත ආකෘති පත්‍ර අනුව ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. තවද ඒ සම්බන්ධව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් කිසිදු අයුරකින් ලංසුකරුවන් දැනුවත් කිරීමක්ද කර නොතිබුණි

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 මාර්ගෝපදේශ ප්‍රකාර ඇස්තමේන්තු ගත කොන්ත්‍රාත් මුදලින් සියයට 10 කට නොඅඩු යෝග්‍ය මුදල්මය සුරක්ෂණ මගින් වගකීම් පිළිබඳ බැඳීම් ආවරණය කර ගත යුතු වුවද 2017/2018 ආරක්ෂක සේවා වියදම් රු. 2,142,000 ක් හා පවිත්‍රතා වියදම රු. 3,360,000 ක් සම්බන්ධයෙන් කාර්යසාධන සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි.

## 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ භෝජනාගාරයේ යෝජිත අභ්‍යන්තර අලංකාර කටයුතු සිදු කිරීම සඳහා 2017 ඔක්තෝබර් 14 දින ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලිය යටතේ ලංසු කැඳවීම් සිදුකර තිබුණි. ලංසු කරුවන් 03 දෙනෙකුගෙන් ලංසු ඉදිරිපත් වි තිබූ අතර ඒ අතරින් කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීමට කටයුතු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන සංග්‍රහය 6.2.2 විධිවිධාන ප්‍රකාරව ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ අවම කාල සීමාව දින 21 ක් වුවද, මෙම ප්‍රසම්පාදනය වෙනුවෙන් ලංසු කැඳවීමට ලබා දී තිබුණේ දින 12 ක් පමණි.

(ii) රජයේ ප්‍රසම්පාදන සංග්‍රහය 7.3.1.(ආ) විධිවිධාන ප්‍රකාරව උපදේශකයන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයන් නොවිය යුතු වුවද අදාල ප්‍රසම්පාදන වෙනුවෙන් පත් කරන ලද උපදේශකයෙකු තාක්ෂණික ඇගයීම් කමිටුවේද සාමාජිකයෙකු වී තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අතිරේක 18 විධිවිධාන ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කිරීම සඳහා නියමිත කාල සීමාව දීර්ඝ කිරීමකදී සුරක්ෂණයෙහි තහවුරු කර ඇති වලංගු දින ඉකුත් වීමට පෙර සුරක්ෂණයන් දීර්ඝ කරගත යුතු වුවත් ඉහත කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් 2018 මාර්තු 06 දින වන විට රු. 1,882,638ක් වූ අත්තිකාරම් සුරක්ෂණයේ සහ 2018 මාර්තු 07 දින වන විට රු.802,488 ක් වූ කාර්ය සාධන සුරක්ෂණයේ වලංගු කාලසීමාව අවසන් වී තිබුණි. සුරක්ෂණය මත කොන්ත්‍රාත්කරුට රු. 1,882,638 ක සචලීකරණ අත්තිකාරම් මුදලක්ද 2018 ජනවාරි 03 දින ලබා දී තිබුණද 2018 ජුනි 30 දින වන විටත් ආයතනය විසින් භෝජනාගාරයේ යෝජිත අභ්‍යන්තර අලංකාර කටයුතු සිදුකිරීම ආරම්භ කර නොතිබුණි.

(ආ) පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රයට අදාල පාඨමාලා සහ පශ්චාත් උපාධි සහ උපාධි වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය මූලික පහසුකම් සපයා ගැනීමේ අරමුණින් ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 2015 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් දක්වා රු. මිලියන 23ක් භාණ්ඩාගාරයෙන් ලබා දී තිබුණි. ඉන් රු. 1,586,831ක් ප්‍රධාන සැලැස්ම හා පස් සාම්පල් පරීක්ෂාව සඳහා පමණක් 2018 මැයි 31 වන විට වැය කර තිබුණු අතර ඉදිකිරීම් කටයුතු 2018 ජූලි 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. ඉතිරි රු. 21,413,619 මුදල ආයතනයේ කෙටිකාලීන තැන්පත් වල ආයෝජනය කර තිබුණි.

## 6.2 අයවැය පාලනය

--------------------

අයවැයගත ආදායම හා වියදම සහ තථ්‍ය ආදායම් හා වියදම අතර සියයට 10 සිට සියයට 310 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 7 පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පද්ධති හා පාලන | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ණයගැතියෝ | ණයගැති ශේෂ විධිමත් පරිදි අයකර ගැනීමේ වැඩපිළිවෙලක් ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | පාඨමාලා පැවැත්වීම | විභාග කටයුතු අපක්ෂපාතීව සහ ක්‍රමවත්ව සිදු කිරීම සඳහා විභාග අංශයක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන කටයුතු | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. |